# දරුවන් උදෙසා බයිබලයක්



## පීඩාකරුගෙන් දේශනාකරුට!

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.



මුල් සභාවේදී
දෙවියන්වහන්සේ
තම සෙනඟ හරහා
මහත් දේවල්
කළ සේක.

පිලිප් නම්වූ මනුෂ්‍යයෙක්,
ජනාකීර්ණ නගරයක හිඳ
මිනිසුන්ට ජේසුස් වහන්සේ
ගැන කීවේය. නමුත්
දෙවියන් වහන්සේ ඔහුව
කාන්තාරයකට
යැව්වේ මන්ද?



ඉතියෝපියාවේ කන්දකී
බිසව යටතේ සිටි පාලකයෙකු
කාන්තාරයේ ගමන් කරමින්
සිටින බව දෙවියන් වහන්සේ
දැන සිටි සේක. ඔහු නිවස බලා
යමින් සිටි අතර විශේෂ පොතක්
කියවමින් සිටියේය. ඔබට ඔහු
කියවමින් සිටි පොත කුමක්දැයි
අනුමාන කළ හැකිද?



පිලිප්
දෙවියන්
වහන්සේට කීකරු වූ
විට, උන්වහන්සේ ඔහුව
කෙළින්ම ගෙන ගියේ දේවවචනය
තේරුම් නොගෙන කියවන ඒ පාලකයා
වෙතටය. ඔහු පිලිප්ට තමා හා
එක්වන ලෙස ආරාධනා කළේය.

"මෙහි අර්ථය කුමක්ද?" පාලකයා පිලිප්ගෙන් ඇසුවේය. අශ්ව රථය කාන්තාර පාර දිගේ වේගයෙන් ගමන් කරන අතර, පිලිප් ඔහුගේ මුඛය විවෘත කර, එම ශුද්ධ ලියවිල්ලෙන් පටන්ගෙන, ජේසුස් වහන්සේ ගැන ඔහුට දේශනා කළේය.





අප්‍රිකානු පාලකයා
ඉක්මනින්ම බයිබලයේ
පණිවිඩය, එනම් ජේසුස් ක්‍රිස්තුස්
දෙවියන්ගේ පුත්‍රයාණන් බව
විශ්වාස කළේය. ඔහු වතුර තිබෙන
තැනක් දැක, “බෞතීස්ම වීමට මට
ඇති බාධාව කුමක්දැ?”යි ඇසුවේය.

“ඔබේ මුළු හදවතින්ම ඔබ විශ්වාස කරන්නේ නම්, ඔබට එය කළ හැකියැ”යි පිලිප් කීවේය. “ජේසුස් ක්‍රිස්තුස්, දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව මම විශ්වාස කරමි”යි පාලකයා පිළිතුරු දුන් විට, පිලිප් ඔහුව වතුරට ගෙන ගොස් බව්තීස්ම කළේය.



ඔවුන් වතුරෙන් ගොඩට පැමිණි විට, ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආත්මය පිලිප්ව ගෙනගිය සේක. එබැවින් අප්‍රිකානු පාලකයා තව දුරටත් ඔහුව දුටුවේ නැත. ඔහු ප්‍රීතියෙන් ඉතියෝපියාවට ආපසු ගියේය!



නමුත් සමහර අය කිතුණුවන්ට වෛර කළෝය. පිලිප්ගේ මිතුරෙකු වූ ස්තේපන්ව, ඔහු ජේසුස් වහන්සේ ගැන කතා කරනවාට අකමැති වූ කෝපයට පත් මිනිසුන් විසින් මරා දමා තිබුණි. තාර්සස්හි සාවුල් නම් මිනිසෙක් ස්තේපන්ව මරා දැමීමට උදව් කර තිබුණේය. සාවුල් සියලු කිතුණුවන්ට වෛර කළේය.



සාවුල්, කිතුණුවන්ට එරෙහිව
තර්ජන කරමින් සහ මරමියි
කියමින්, උත්තම පූජකයා වෙත
ගොස්, ජේසුස් වහන්සේගේ
අනුගාමී පිරිමින් හෝ කාන්තාවන්
හෝ අත්අඩංගුවට ගැනීම සඳහා
අයිතිය ලබා දෙන ලිපි ලබා
ගත්තේය.





අසරණ තාර්සස්හි සාවුල්! ඔහු දෙවියන් වහන්සේගේ සෙනඟට රිදවන විට, ඔහු සැබවින්ම රිදවන්නේ ස්වාමිවූ ජේසුස් වහන්සේටම බව ඔහු දැන සිටියේ නැත. සාවුල්ව නවත්වන්න දෙවියන් වහන්සේට සිදුවේ. නමුත් ඒ කෙසේද?

දෙවියන් වහන්සේ සාවුල්ව
“තම අත්අඩංගුවට
ගත්සේක!” සාවුල් දමස්කස්
නගරයට යන මාර්ගයේ
යමින් සිටියදී, දෙවියන්
වහන්සේ ස්වර්ගයෙන් විශාල
ආලෝකයක් බබළවන්නට
සැලැස්වූ සේක. සාවුල් බිම
වැටුණේය. ඉන්පසු ඔහුට
හඬක් ඇසුණි.





“ස්වාමීනි, ඔබ කවුද?” සාවුල් කෑගැසුවේය.
“මම ඔබ පීඩා කරන ජේසුස් වහන්සේ
වෙමි.” වෙවුලමින් විශ්මයට පත් වූ සාවුල්,
“ස්වාමීනි, ඔබට මා කුමක් කළ යුතුදැ”යි ඇසී
ය. එවිට ස්වාමීන් වහන්සේ ඔහුට කතා
කොට, “නැඟිට නගරයට යන්න, ඔබ කළ
යුතු දේ ඔබට කියනු ඇතැ”යි කීසේක.

සාවුල් සමඟ සිටි
මිනිසුන්ටද ඒ හඬ ඇසුණු
නමුත් ඔවුන්ට කිසිවෙක්
නොපෙනුණේය. සාවුල්
නැඟිට සිටියේය. ඔහු
අන්ධව සිටියේය! ඔව්හු
ඔහුව දමස්කයට ගෙන
ගියෝය.



නගරයේදී සාවුල් දවස් තුනක්
පෙනීම නැතිව, කෑමවත්
බීමවත් නොගෙන සිටියේය.
ඇතැම් විට ඔහු දමස්කයට යන
මාර්ගයේදී තමාට හමු වූ
ස්වාමීවූ ජේසුස් වහන්සේට
යාච්ඤා කරමින් කාලය ගත
කළා විය හැකිය.



දෙවියන් වහන්සේ සියල්ල සැලසුම් කර තිබුණි. දමස්කයේ අනනියස් නම් ගෝලයෙක් සිටියේය. ස්වාමින් වහන්සේ සාවුල්ට උදව් කිරීමට ඔහුව එවූ සේක. අනනියස් බිය වුණේය. නමුත් ඔහු දෙවියන් වහන්සේට කීකරු වූයේය. ඔහු සාවුල්ට අත තැබූ විට අන්ධභාවය පහව ගියේය - සාවුල් දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන්ගෙන් පිරී ගියේය.



සාවුල්ව බව්තීස්ම කරනු ලැබුණි. ඉන්පසු ඔහු කෑම කෑවේය. ආහාර ලබා ගත් පසු ඔහු ශක්තිමත් වූයේය. සාවුල්ට ශක්තිය අවශ්‍ය විය. ඔහුට ඉතා වැදගත් දෙයක් කිරීමට තිබුණි.



සාවුල් සිනගෝගවලදී ක්‍රිස්තුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් බව දේශනා කළේය. එවිට අසා සිටි සියල්ලෝ විස්මයට පත් වී, “මේ කිතුණුවන් විනාශ කළ තැනැත්තා නොවේ දැ”යි ඇසුවෝය. සමහරු සාවුල්ව මරන්න කුමන්ත්‍රණය කළෝය.





සාවුල්ගේ අලුත් සතුරන් සාවුල් නගරයෙන් පිටවීමට උත්සාහ කළහොත් ඔහුව මරා දැමීමට නගරයේ දොරටු දෙස බලා සිටිද්දී  ඔහුගේ අලුත් මිතුරන් වූ ක්‍රිස්තියානීන් රාත්‍රියේදී ඔහුව විශාල කූඩයක දමා තාප්පය උඩින් බිමට බැස්සුවේය. එතැන් පටන්, කිතුණුවන්ට පීඩා කළ සාවුල්, ඔහුගේ අලුත් ස්වාමියා වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ විශ්වාසවන්ත අනුගාමිකයෙකු ලෙස ජීවත් වූයේය.

පීඩාකරුගෙන් දේශනාකරුට!

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ක්රියා 8-9

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)